Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල**

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - ජූලි - 3

ශ්‍රේණිය - 13

සකස් කළේ-රංජිත් ඥානසිරි මයා,ර/ගන්කන්ද මධ්‍ය විද්‍යාලය.

නිපුණතාව 9 - විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 9.1 - අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ සාධක විමර්ශනය කරයි.

9.2 - ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග හා එමගින් නිදහස් වෙළෙඳාමට ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි.

1. විදේශ වෙළෙඳාමට සම්බන්ධ වීමේ වාසි විග්‍රහ කිරීමේදී,සාපේක්ෂ වාසි න්‍යායට සාපේක්ෂය නිරපේක්ෂ වාසි න්‍යායේ පවතින දුර්වලතාවය පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.
2. සාපේක්ෂ වාසි න්‍යාය පදනම් කර ගනු ලබන උපකල්පන මොනවාද?
3. ජර්මනිය හා ස්විට්සර්ලන්තය යන රටවල ශ්‍රම ඒකකයක නිමවුම පහත පරිදි වේ.

| භාණ්ඩය | ජර්මනිය | ස්විට්සර්ලන්තය |
|---|---|---|
| ඔරලෝසු | 20 | 4 |
| රූපවාහිනී | 10 | 6 |

- දෙරට සතුවම ශ්‍රම ඒකක 1,000 බැගින් පවතින බවද උපකල්පනය කරන්න.

(අ) එක් එක් භාණ්ඩය සඳහා සාපේක්ෂ වාසිය පවතින රට හඳුනා ගන්න.
(ආ) දෙරට ජාත්‍යන්තර වෙළෙඳාමට පිවිසුන හොත් දෙරට අතර ඔරලෝසුවකට හුවමාරු කර ගත හැකි රූපවාහිනී ප්‍රමාණය තීරණය කිරීමට යෝග්‍ය හුවමාරු අනුපාත 2ක් යෝජනා කරන්න.
(ඉ) දෙරටේ නිෂ්පාදන හැකියා මායිම් නිර්මාණය කරන්න.

4. ආරක්ෂණවාදයට විපක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක 4ක් සඳහන් කරන්න.
5. රටක් නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් පවත්වා ගෙන යාමෙන් ඇති විය හැකි අවාසි මොනවාද?